


# නිදහස් මාධ්‍ය

නිදහස් නිවහල් දේශයක් උදෙසා


ගවේෂණාත්මක
පැහැදිලිව
සංවේදීබව
පෙළගැස්ම
වෘත්තීය
අයිතීන්
නියාමනය
පෙරළිකාරීත්වය
ප්‍රේක්ෂක විශ්වසනීයත්වය
ආචාරධර්ම
ආකල්ප
මර්දනය
හෘද සාක්ෂිය
සමබරව
වාරණය
වාරණය
ආයතන ප්‍රධානීන්
මූලාශ්‍රවල රහස්‍යභාවය
ප්‍රතිපත්ති
නිර්මාණාත්මකබව
අභියෝග
සමාජ ආකල්ප
ජයගැනීම
මාධ්‍ය
භාෂණයේ නිදහස
තර්ජන
ජාත්‍යන්තර සම්මුතීන්
සත්‍යය සහ අවබෝධය
කුතුහලය
තහනම
අතික්‍රමනය
මහජන මතය
අවධානය
තොරතුරු

# ක්‍රමාධ්‍ය

© රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

ISBN 978-955-9073-20-8

ප්‍රධාන සංස්කාරක
**මහාචාර්ය ආරියරත්න ඇතුගල**

සංස්කරණය
**මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විජයානන්ද රූපසිංහ**

නිර්මාණ සැලසුම
**අනුහස් මහවලගේ**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

*2013 මැයි 03 දිනට යෙදෙන*
*ලෝක නිදහස් මාධ්‍ය දිනය සැමරුමේ*
*විසි වැනි සංවත්සරය වෙනුවෙන් ද,*
*කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයට*
*හතළිස් වසරක් පිරීම හා*
*දෙසතිය සඟරාවට තිස්පස් වසරක් පිරීම ද සමරමින්*
*ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන්*
*‘2010 ජාතික ජනමාධ්‍ය සමුළුවේ දී’ පිහිටුවා ගත්*
*විශ්වවිද්‍යාල ජනසන්නිවේදනය පිළිබඳ*
*ආචාර්යවරුන්ගේ සංගමයේ ශාස්ත්‍රීය දායකත්වයෙන්*
*මෙම කෘතිය එළිදැක් වේ.*

–



**මහාචාර්ය**
**ආරියරත්න ඇතුගල**
ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය



# නිදහස් මාධ්‍ය හා
# හතරවැනි යාය / ශාඛාව

දේශපාලනය හා මාධ්‍ය අතර දැඩි බැඳීමක් පවතී. එයට ප්‍රධාන හේතුව රටවල් පාලනය උදෙසා මාධ්‍ය අත්‍යවශ්‍ය මෙවලමක් බවට පත් ව තිබීම යි. එසේ ම දේශපාලනඥයින් හා මාධ්‍ය අතර ඇත්තේ ද අන්‍යෝන්‍ය සුභසාධන (Mutual benefit) හා පරායත්ත (Dependence) වූ එකිනෙකා මත වාසිදයක යැපීම පදනම් කොට ගත් (Symbiotic) සම්බන්ධතාවකි.

නූතන මාධ්‍ය දේශපාලනික පුවත් වාර්තාකරණයේ දී වඩාත් ඉලක්ක වන්නේ ගැටුම් හා ඍණාත්මක තෝරා ගැනීම් ය. එහි දී තුරඟ තරගයක දී මෙන් ඉදිරියෙන් දුවන අශ්වයින් පිළිබඳ ඔවුන්ගේ අවධානය වඩාත් යොමු වේ. මෙලෙස ධනාත්මකයේ සිට ඍණාත්මකය දක්වා දිවෙන වාර්තාකරණයෙහි අලංකාරය සවිස්තරාත්මකයේ සිට අර්ථකථන දක්වා පුළුල් පරාසයක භාවිත වේ. වත්මන් මාධ්‍යකරුවා නිරන්තර ව තරගකාරී පීඩනයකට (Competitive Pressure) හසුව සිටින අතර දියුණු මාධ්‍ය තාක්ෂණය එම තරගකාරිත්වය වඩාත් තීව්‍ර කර තිබේ.

අලුත් යෙදුම් ආ විට, ලියන, කියන හා දේශනවල දී සන්නිවේදනය අපි දූ දන්නේ යැයි හැඟවීමට උත්සාහ දරන ඇතැම්හු මාධ්‍ය 'හතර වැනි

ආණ්ඩුව' ලෙස හඳුන්වති. හතර වැනි ආණ්ඩුවක් ගැන විශේෂඥ මතයක් ලෝකයේ කිසිදු තැනෙක ශාස්ත්‍රීයව සාකච්ඡා වී නොමැත. 'හතර වැනි ආණ්ඩුව' යන්න නිරවුල් යෙදුමක් නොවේ. එය 'හතර වැනි ආණ්ඩුව' හෝ 'හතර වැනි රාජ්‍යය' (Fourth State) හෝ නොව 'හතර වැනි යාය' (Fourth Estate) යනුවෙන් නිවැරදි විය යුතු ය.

හතර වැනි යාය (Fourth Estate) යන්න බ්‍රිතාන්‍යයේ දීර්ඝ ඉතිහාසයක් තුළ වැඩී බිහිවන සංකල්පයකි. මෙම සංකල්පය මගින් පුවත්පත්හි ස්වාධීනතාව ගොඩනැගීමේ ඇති අවශ්‍යතාව පෙන්වා දී ඇත.

වැඩවසම් සමාජ ක්‍රමය (Feudal Society) යටතේ පැවති පාදිලිවරු (Clergy), රදල පැලැන්තිය (Nobility) හා මහජනතාව (Commoners) යනුවෙන් රාජ්‍යය සැදී තිබුණි. බ්‍රිතාන්‍ය දේශපාලන න්‍යායාචාර්ය එඩ්මන් බර්ක් (Edmund Burke) (1729 - 1797) පෙන්වා දෙන්නේ ආධ්‍යාත්මික නායක (Lords Spiritual) ලෞකික නායක, (Lords Temporal) සහ පොදු ජනතාව (Commons) යන්න පුරාණ පාර්ලිමේන්තු සංදර්භය ගොඩනැගීමට බලපෑ බව යි. විශේෂයෙන් 1787 දී මොහු විසින් බ්‍රිතාන්‍ය මහජන සම්මන්ත්‍රණ මණ්ඩලය (House of Commons) පුවත්පත් ආවරණයට විවෘත කළ පළමු අවස්ථාවේ මහජන ගැලරියේ සිටි මාධ්‍යකරුවන් හතර වැනි යාය (Fourth Estate of The Realm) ලෙස නම් කරන ලදී.

වත්මන් ප්‍රජාතන්ත්‍රවාදී රටවල මාධ්‍ය, රාජ්‍ය ප්‍රතිපත්ති විවේචනය කිරීමේ භූමිකාවක යෙදේ. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය මඟින් නියෝජනය කෙරෙන රාජ්‍ය ක්‍රියාකාරකම්වල දී මාධ්‍ය බලවත් වූත් අත්‍යවශ්‍ය වූත් අංගයක් ලෙස සැලකේ. මාධ්‍යයේ මෙම අනුපූරක කාර්යය 'හතර වැනි යාය' (ශාඛාව) ලෙස හැඳින්වෙන අතර එය 18 වන සියවසේ බ්‍රිතාන්‍ය ශාස්ත්‍රවන්තයකු වන තෝමස් කාලයිල් (Thomas Carlyle) මුලින් ම හඳුන්වා දෙන ලද සංකල්පයකි. මේ යටතේ සිදු වූ සංවාදය මඟින් රාජ්‍ය ප්‍රතිපත්ති හා රාජ්‍ය නායකයන් විවේචනය කිරීමේ නිදහස මාධ්‍යයට හිමි විය. ඒ අනුව හතර වැනි ශාඛාව වන මාධ්‍යයේ කාර්යය වන්නේ දේශපාලන ක්‍රියාකාරකම් ජනතාව ඉදිරියේ විනිවිදභාවයට පත් කිරීම යි. එසේ ම වඩාත් බලවත් ජාත්‍යන්තර සබඳතා සහිත දේශපාලන පසුබිමක දී නම් ජාත්‍යන්තර දේශපාලනය පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම සඳහා මාධ්‍ය දැඩි අවධානයක් යොමු කළ යුතු ය (මැක්නයිට්, තෝමස් 1858).

ඒ අනුව ජාත්‍යන්තර දේශපාලනයේ දී ජනමාධ්‍යයේ හතර වැනි ශාඛාවේ කාර්යභාරය දෙයාකාරයකින් පිළිබිඹු වේ. පළමුවැන්න රජය සහභාගි වන ක්‍රියාකාරකම් වාර්තා කිරීම මගින් විනිවිදභාවයකින් හා පුළුල් පරාසයක විහිදුණු තොරතුරු සාමාන්‍ය ජනතාව වෙත ලබා දීම යි. ගැඹුරු විමර්ශන ඉදිරිපත් කිරීම මගින් රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස් කිරීමට හේතු වන ලෙස මහජන මතයේ ප්‍රවණතාවන්ට මග පෙන්වීම දෙවැන්න යි (බ්‍රසි, ඊ. පී හා නිව්හැගන් ජේ. ඊ, 2004). 2009 සැප්තැම්බර් 24 රොයිටර් පළ කළ න්‍යෂ්ටික අවි රහිත කලාපයක් ස්ථාපිත කිරීම සම්බන්ධ ප්‍රවෘත්තිය ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජිකයන්ගේ ආකල්පය අවධානයට ලක් කෙරුණ අතර එමගින් මාධ්‍යයේ මුර බල්ලාගේ භූමිකාව පිළිබිඹු වූ බව මතයකි. මැද පෙරදිග න්‍යෂ්ටික අවි තහනමට එක්සත් ජනපදය හා අනෙකුත් බලවත් රටවල් සහාය දක්වන අයුරු රොයිටර් ප්‍රවෘත්ති වාර්තා පදනම් කරගෙන සාකච්ඡා කෙරුණි. මාධ්‍යයේ හතර වැනි යායේ භූමිකාව ද සාම්ප්‍රදායික බටහිර බලවතුන්ගේ න්‍යෂ්ටික ප්‍රතිපත්තිය පිළිබඳ රොයිටර්හි දැක්ම හා ආකල්පය ද වඩාත් පිළිබිඹු වන්නට පටන් ගැනුණේ මෙතැන් සිට ය.

මෙලෙස බිහිවන හතර වැනි යාය නමැති මෙම සංකල්පය ඊට සියවස් දෙකකට පසු වඩාත් ප්‍රචලිත ව ස්ථිර වේ. එයට හේතුව වූයේ එම කාලය තුළ මාධ්‍ය පුළුල් අධිකාරිත්වයකට පත් වීම යි. මෙම සංකල්පය ඇමරිකානු විශේෂඥතාව මගින් පසු කාලීන ව හතර වැනි ශාඛාව (Fourth Branch) ලෙස ද හඳුන්වා දී ඇත. එමගින් ඔවුන් පුවත්පත ස්වාධීන නොවන, රාජ්‍යයේ ම කොටසක් ලෙස අර්ථ විග්‍රහ කෙරුණි.

මධ්‍යයේ හතර වැනි ශාඛාවෙන් බටහිර රාජ්‍ය ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් පරික්ෂා කිරීමේ හා හෙළි කිරීමේ කාර්යය මුර බල්ලාගේ ජනමාධ්‍ය භූමිකාවෙන් පිළිබිඹු වේ (පොල්සෙල්ලි, ඉයුජිනියා 2011). විශේෂයෙන් මේ මුර බල්ලාගේ භූමිකාව ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා සංස්කෘතික වශයෙන් ඒකාබද්ධ යුගයක ගෝලීය විවේචනයන් සඳහා වැදගත් වේ.

වර්තමානය වන විට මේ තත්ත්වය වෙනස් වී පස් වැනි ශාඛාව/යාය යන්න ද ගොඩනැගී ඇත. 2008 බැරැක් ඔබාමාගේ ඡන්ද ව්‍යාපාරයේ දී ප්‍රධාන මාධ්‍ය, ප්‍රතිපත්තියක සිට ක්‍රියා කළ අතර සමාජ මාධ්‍ය ලෙස twitter, blogs, face book යනාදිය අන්තර් ක්‍රියාකාරී මාධ්‍ය ලෙස ප්‍රබල දේශපාලන

විවේචනයක යෙදුණි. මේ පසුබිම අධ්‍යයනය කරන ඔක්ස්පර්ඩ් ඉන්ටර්නෙට් ආයතනය (The Oxford Internet Institute) (OII) සමාජ ජාල පස් වැනි යාය/ශාඛාව ලෙස (Fifth Estate) නම් කරයි. මෙ මගින් වඩාත් අවධාරණය කරන්නේ එක් මාධ්‍යයකින් බහු මාධ්‍ය ජාලාවන්ට (one to many mass media) සන්නිවේදනය කිරීමේ සංකීර්ණ වූත් දියුණු වූත් ජාල පදනම යි.

මහාචාර්ය විලියම් එම්. ඩුටොන් ( Prof. William M. Dutton) අන්තර්ජාලා තහවුරු කරන පස් වැනි යාය (The Fifth Estate of the Internet Realm) සංකල්පය මඟින් සාම්ප්‍රදායික ආයතනික අධිකාරිත්වයන් අභියෝගයට ලක්වන බව පවසයි. කුඩා ජන කණ්ඩායම්වලට නිර්මාණය කිරීමේ හැකියාව ඉන් ලැබුණි. කුඩා ජන කොටස්වල විරෝධතා සමාජ මාධ්‍ය මගින් බලවේගයක් ලෙස දක් විණි. 19 වැනි සියවසේ ජීවත් වූ දර්ශනික එඩ්මන්ඩ් බෑන්ක් මයිට් (Edmund Bank Might) දක් වූයේ මේ ස්වභාවය ජනෝඝය (Mob) නමිනි. කෙසේ වුව පස් වැනි යාය/ශාඛාව විශ්වීය පදනමින් විශ්ව අන්තර් ජාලා ප්‍රවේශ මත සිදු වන්නකි.

පස් වැනි යාය/ශාඛාව සංකල්පය සාම්ප්‍රදායික සන්නිවේදන මාධ්‍යයන්හි දිගු වීමක් නොවේ. අන්තර් ජාලා භාවිතයෙන් සන්නිවේදන බලය මහජනයා අතට ගැනීම පිළිබඳ මින් කියැවේ. එ මගින් කිසියම් මාධ්‍ය ආයතනයකට වඩා බලවත්ව දේශීය හා විශ්වීය ජාලා මාර්ග භාවිතයෙන් තොරතුරු, ජනයා හා වෙනත් ප්‍රවේශ ඔස්සේ සන්නිවේදන බලය හැසිරවීමට හැකි වේ. අන්තර් ජාලාවල සන්නිවේදන බලය උපයෝගි කොට ගෙන සාම්ප්‍රදායික මාධ්‍යවල තොරතුරු ප්‍රවේශ ශක්තිමත් කළ හැකි වේ. එසේ ඇති වන පස් වැනි යාය බලගන්වන්නේ ජනෝඝය යි. (Mob)

මේ ක්‍රියාවලියේ වත්මන් ප්‍රභේදනය මෙසේ ය.

| සාම්ප්‍රදායික ශාඛා | නූතන සමාන්තරණය |
|---|---|
| දේවගැති Clergy | පොදු ජන බුද්ධිමත්භාවය |
| රදලයකු Nobility | ආර්ථිකය |
| පොදු ජනයා Commons | රාජ්‍යය |
| පුවත්පත් Press | ජනමාධ්‍ය |
| ජනෝඝය Mob | පුරවැසියා, ප්‍රේක්ෂකයා,<br>පාරිභෝගිකයා හා දත්වැයා (Hacker) |

හතර හා පස් වැනි යාය/ශාඛාවලින් මාධ්‍ය නිදහස පුළුල් ලෙස සමාජයකට ලැබේ. එසේ වුව නොදියුණු මාධ්‍ය සංස්කෘතියක් ඇති රටකට මේ ශාඛාව මගින් රාජ්‍යයකට වන හානිය විශාල බව ද අවධානයට ගත යුතු ය. කෙසේ වුව විශ්වයේ පවත්නා මාධ්‍ය නිදහසට අනුව විවෘත ව අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය මේ ඔස්සේ මහජනතාවට ලැබේ. එමගින් කිසියම් දෙයක් සිදු වීමට පෙර සවිස්තරාත්මක දැනුම්වත් භාවයක් ඇති කර ගත හැකි ය. එසේ ම මේ ඔස්සේ සමාජ දැනුම හා තේරුම් ගැනීම්වලට මග විවර වන අතර මෙ වැනි මාධ්‍ය සම්බන්ධතා මගින් සාමකාමී සමාජ පරිවර්තනයකට ද මඟ පාදගත හැකි ය. විශේෂයෙන් පුද්ගල අයිතීන් දිනා ගැනීම කෙරෙහි විරෝධතා දැක්වීම යනාදිය නිදහස් සමාජයක ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රගමනයට හේතු වන්නකි.

හතර හා පස් වැනි ශාඛාවන්හි මාධ්‍ය හැසිරීම් මඟින් රාජ්‍යයකට අභියෝග ගණනාවකට ද මුහුණ දීමට සිදු වේ. විශේෂයෙන් ප්‍රමාණවත් දැනුම හා විශේෂඥතාව නොමැති නුපුහුණු ජනයාට අන්තර් ජාලා පරිගණක භාවිතයට ලැබෙන අවස්ථාව මඟින් ඇතිවන ගැටලුවලට මුහුණ දීමට සිදු වේ. එසේ ම තොරතුරු උපයෝගීතාව මධ්‍යගත වීම හා පස් වැනි ශාඛාව/යාය අවකාශය වාණිජකරණය වීම අනාගතයෙහි බලපාන අභියෝගාත්මක සන්නිවේදන ප්‍රවේශයක් වේ.

මේ මාධ්‍ය ජාලාවලට වාරණය, නියාමනය හා අන්තර්ජාල ප්‍රවේශවලට බාධා කිරීම යනාදියට ද මුහුණ දීමට සිදු වේ. අනෙක් අතින් මාධ්‍ය සීමා කිරීම හා තරගකාරී වීම ද පස් වැනි ශාඛාව/යාය තුළ දැකිය හැකි විශේෂ තත්ත්වයකි. අන්තර් ජාලාවලට පවත්නා විශ්වසනීයභාවය හා සත්‍යතා අවතක්සේරු වන ආකාරය මත ද්වේශ සහගත හා ක්ෂණික පුවත් මැවීම මගින් බොහෝ ගැටලු ඇති වීමට අවකාශ තිබේ. අන්තර් ජාලා සාම්ප්‍රදායික ආයතනයන්හි ආතතීන් ඇති කිරීමට ද හේතු වේ.

මේ ''බල්ලා''ජනමාධ්‍ය සංකල්පවල ඉතිහාසය සලකා බලන්නේ නම් 1941 සිට 1966 දක්වා බටහිර රටවල 'ඔඩොක්කු බල්ලා' (Lap Dog) ජනමාධ්‍ය කලාව පැවති බව සන්නිවේදන විශේෂඥ මත යැයි. ඔඩොක්කු බල්ලා යන පුද්ගලයින්ගේ අතේ හා තුරුලේ ගැවසෙන බල්ලා ය. දේශපාලනික සංස්ථාපිත දේ ලිවීම ජනමාධ්‍ය කලාව තුළින් සිදු විය යුතු බව එමගින් පෙන්වා දෙයි. පාලකයින් සවිබල ගැන් වූ හා බාර දෙන ලද දේ ලිවීම ඔඩොක්කු බල්ලා සංකල්පය මගින් වඩාත් තහවුරු වේ.

1966 සිට 1974 දක්වා ඇමරිකානු සමාජය ප්‍රමුඛ බටහිර රටවල මුරබල්ලා ජනමාධ්‍ය කලාව (Watchdog Journalism) නැමති ජනමාධ්‍ය සංකල්පය ක්‍රියාත්මක වූ බව දක්නට ලැබේ. සියලු ප්‍රභූ දේශපාලන හැසිරීම් යටත් කොට සියුම් හා නිදහස් ගවේෂණයට ජනමාධ්‍යවලට අවකාශය ලැබීම මෙම සංකල්පය ක්‍රියාවට නැංවීමෙන් සිදු වූ වැදගත් කාර්යයකි. නිදහස් මාධ්‍ය ප්‍රතිපත්ති, මානව හිමිකම් යනාදිය පිළිබඳ සමාජයේ සංස්ථාපිත අවබෝධය මේ සංකල්පය ඉදිරියට පැමිණ වීමට හේතු වූ අතර ජනමාධ්‍ය කලාවේ බලය ජනතාවට මෙ මගින් ලැබුණි. එසේ ම මාධ්‍ය හා ප්‍රජාතන්ත්‍රවාදය අතර ද නිදහස් සම්බන්ධතාවක් ගොඩනැගුණි. මාධ්‍ය චරිතය ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්ම යොමු විය.

මුරබල්ලා යන්නෙහි සමාජ අරුත පෞද්ගලික සම්පත් ආරක්ෂා කිරීමට රඳවා ඇති සුනඛයා යන්න යි. පුද්ගලයින්, ක්‍රියාකාරකම් හා තත්ත්ව ආරක්ෂා කොට රැක බලා ගැනීමේ ක්‍රියාවලිය මෙමගින් ගම්‍ය වේ. මේ සියල්ල අතර ගවේෂණාත්මක ජනමාධ්‍ය කලාව ඉදිරියට පැමිණීම මේ ඔස්සේ තහවුරු කෙරෙන විශේෂ ලක්ෂණයකි. එබැවින් ගවේෂණාත්මක ජනමාධ්‍ය කලාවෙන් තොර ව මුරබල්ලා ජනමාධ්‍ය කලාව ද නිර්වචනය කළ නොහැකි ය. අතීත සමාජ, ආර්ථික, දේශපාලනික තත්ත්ව පරාවර්තන මේ සංකල්පය බිහිවීම උදෙසා පාදක විය. ජනමාධ්‍යයේ අද්විතීය බලය මෙ මගින් සමාජගත කළ හැකි බව ප්‍රකට මතයකි. මුරබල්ලා සංකල්පය මුරකරු (Watchman) ලෙස ද හැඳින් වේ.

මැද පෙරදිග කලාපය දෙවැනි ලෝක යුද්ධයෙන් පසු ව දිගු කලක් තිස්සේ ලෝකයේ ගැටලු සහිත කලාපයක් ලෙස පැවතිණ. ලෝක යුද්ධයෙන් පසු කලාපීය යුද්ධවලින් 60%කට අධික ප්‍රමාණයක් එම කලාපය තුළ සිදු විය. මේ යුද්ධවල කේන්ද්‍රීය තේමාව වූයේ යුදෙව් ගැටලුව හා ඊශ්‍රායලයේ රාජ්‍ය ප්‍රතිපත්තිය යි. ලෝක දේශපාලන බලය ඊශ්‍රායලයට හිතවත් හා අරාබි රටවලට හිතවත් ලෙස දෙකොටසකට බෙදා දැක්විය හැකි ය. ජාත්‍යන්තර මාධ්‍ය මෙම කලාපයේ කටයුතු පිළිබඳ දැඩි අවධානයක් යොමු කරයි. ලෝක බලවතුන් මැද පෙරදිග කලාපය පරීක්ෂා කිරීමේ කාර්යක නිරත වීම කෙරෙහි අවධානය යොමු කරන ආකාරය මාධ්‍ය පෙන්නුම් කරයි. එසේ ම මේ ප්‍රදේශය තුළ න්‍යෂ්ටික අවි පැතිරීමට විරුද්ධ ව කටයුතු කරන ජාත්‍යන්තර ලෝකය දෙස ජාත්‍යන්තර මාධ්‍ය අවධානය යොමු කරයි. මෙවැනි ජාත්‍යන්තර තත්ත්ව ඔස්සේ මුරබල්ලාගේ භූමිකාව විවිධ

ආකාරයෙන් වටහාගත හැකි ය. කෙසේ වුව මෙ වැනි ප්‍රවෘත්ති ඔස්සේ මුරබල්ලා සංකල්පය ද බටහිර බලවතුනට වාසි සහගත ව හැසිරෙන අයුරු ද අවධානයට ගත හැකි ය.

ලෝක සාමය ස්ථාපිත කිරීම විශ්වීය ලෙස පිළිගත් දේශපාලන මූලධර්මයක් වුව එය ක්‍රියාවට නැංවීම එලෙසින්ම දක ගත නොහැක. ඓතිහාසික සාධක හා විවිධාකාර ආගමික හා සංස්කෘතික ගැටුම් හේතුවෙන් ද ලෝක සාමයට යන ගමන අඩාළ වී ඇත. දේශපාලන බලවතුන් න්‍යෂ්ටික අවි සංවර්ධනය කිරීම එකී තත්ත්වය තවත් අසුභ අතට හැරවීමට හේතු වී ඇත. මෙ වැනි අවි වැරදි ලෙස භාවිත කළහොත් එය සමස්ත ලෝකයට ම තර්ජනයක් විය හැකි ය. එම ප්‍රදේශය දෙස ලෝක මාධ්‍ය විමසිල්ලෙන් සිටිය ද න්‍යෂ්ටික අවි සම්බන්ධ ක්‍රියාදාමය එලෙසම සිදු වේ. රාජ්‍ය ක්‍රියාකාරකම් හා මාධ්‍ය අතර අන්තර් ක්‍රියාවන්හි ප්‍රතිඵල ලෙස මාධ්‍ය වාර්තා විශාල ප්‍රමාණයක් පළ වේ. එ ලෙස ලෝක බලවතුන්ගේ මැද පෙරදිග සාමය ආරක්ෂා කිරීමේ ව්‍යාපාරය නූතන ජාත්‍යන්තර මාධ්‍යයන් හි ප්‍රධාන අමුද්‍රව්‍ය වේ. කෙසේ වෙතත් අනෙක් අතට එම වාර්තා හා විමර්ශන ලෝක ප්‍රතිපත්තිවලට දිශානතියක් සපයයි.

ප්‍රධාන රටවල දේශීය ප්‍රතිපත්තිවල වැදගත් අංශයක් වන ජාත්‍යන්තර සම්බන්ධතා, රටක රාජ්‍ය ප්‍රතිපත්ති කෙරෙහි ද බලපායි. ජාත්‍යන්තර සබඳතා යනු යම් රටක් ලෝක සාමය පිළිබඳ දක්වන ආකල්ප තර කර ගැනීමේ ක්‍රියාවලිය යි. රජයේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආකල්ප වර්ධනය කිරීමට මාධ්‍යයට වගකීමක් පවතී. බොහෝ බලවත් රටවල ජාත්‍යන්තර සබඳතා කෙරෙහි ඒ රටවල මාධ්‍ය මඟින් නියෝජනය කරන පොදු ජන මතවාද බලපායි. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදී රටවල ආණ්ඩුවලට මාධ්‍යයේ හඬ නොසලකා හැරිය නොහැකි වේ. අනෙක් අතින් ප්‍රජාතන්ත්‍රවාදී බටහිර රටවල ඉහත දක්වූ ප්‍රවෘත්ති වාර්තාකරන මගින් ඇඟවෙන්නේ ඔවුන් මහජන මතය නොසලකා හැර ඇති බව යි. එය ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික සිද්ධාන්තවලට පටහැනි ය. එහෙත් ලෝකයේ බලවත් බොහෝ රටවල් හිතාමතා ම එලෙස මහජන මතයට පටහැනි ලෙස හැසිරේ.

එසේ ම මාධ්‍යයේ මුරබල්ලාගේ භූමිකාව රජයේ බලපෑමෙන් තොර වූ මාධ්‍යයේ හරයාත්මක අගයන් මඟින් පිළිබිඹු වන්නකි. මාධ්‍ය රජයේ මතයට වඩා මහජනයාගේ මතය වෙත අවධානය යොමු කරයි. අතීතයේ මෙන් මාධ්‍ය රජයේ ප්‍රචාරණ මාධ්‍යයක් නො වී රාජ්‍ය ප්‍රතිපත්ති සූක්ෂ්ම ව

පරික්ෂා කිරීමේ වගකීම තමා වෙත පවරා ගනී. ජාත්‍යන්තර කටයුතුවල දී මාධ්‍ය මහජන මතය නියෝජනය කිරීම මඟින් ජන මතය යථාවත් කර ගනී. මෙ ලෙස මාධ්‍යයේ ස්වාධීන අගය යනු රාජ්‍ය ප්‍රතිපත්තිවලට බලපෑම් කිරීම සඳහා මාධ්‍යයේ හතර වැනි ශාඛාවේ භූමිකාව රඟදැක්වීම ලෙස ද දැක්විය හැකි ය. ඒ අනුව ප්‍රවෘත්ති වාර්තා කිරීම අහඹු ලෙස සිදු නොකර මහජන මතයට අනුකූල වන ලෙස ප්‍රවෘත්ති තෝරා ගැනීමකින් යුතුව වාර්තා කිරීම අපේක්ෂා කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස මාධ්‍ය මහජන ආකල්ප කෙරෙහි මෙන් ම රාජ්‍ය ප්‍රතිපත්ති කෙරෙහි ද බලපෑම් කිරීම මඟින් සමාජයේ ම හරයාත්මක අගය පිළිබඳ වගකීම පවරා ගනී. රාජ්‍ය ප්‍රතිපත්තිය කෙරෙහි බලපාන හතර වැනි බලය ලෙස මාධ්‍ය හඳුන්වන්නේ මේ භූමිකාව මත පදනම් වෙමිනි. මාධ්‍යයේ වගකීම ජනතාවට යහපතක් ගෙන ඒම යි. එ බැවින් එවැනි වගකීමක් විෂය මූලික හා මධ්‍යස්ථ විය යුතු ය. එය සමාජයේ කුඩා කොටසකට වඩා ප්‍රධාන ධාරාව නියෝජනය කළ යුතු ය. ඒ අනුව මාධ්‍යයේ ස්වාධීන අගය යනු පොදු මහජන අගය වේ. මෙ ලෙස ජාත්‍යන්තර ගැටලු කෙරෙහි ඔවුන් දක්වන ආකල්ප තුළ ප්‍රවෘත්ති මාධ්‍යයේ හරයාත්මක අගය ද අඩංගු වේ.

ප්‍රජාතන්ත්‍රවාදී රටවල මාධ්‍යවලට රාජ්‍ය ප්‍රතිපත්ති ගැඹුරින් පරීක්ෂා කිරීමේ විශේෂ වගකීමක් පවතී. මේ වගකීම ඉටු කිරීම මඟින් මාධ්‍ය මහජන ජීවිතයට ශක්තියක් වීමෙන් තම හරයාත්මක අගය ගොඩනඟා ගනී. මෙලෙස මාධ්‍යයේ මේ කාර්යය හතර වන ශාඛාව ලෙස හැඳින්වීමට ශාස්ත්‍රවන්තයෝ පෙලඹුණ අතර මෙය මාධ්‍යයේ වැදගත් භූමිකාවක් මෙන් ම ප්‍රජාතන්ත්‍රවාදී රටක කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය වැදගත් යාන්ත්‍රණයක් ද වේ.

1974න් මෙ පිට ක්‍රියාත්මක වන්නේ "අබිලි අංගන ජනමාධ්‍ය කලාව" (Junkyard dog Journalism) යි. ඉවත ලද අපද්‍රව්‍ය දමන ස්ථානයක් සේ මාධ්‍ය වාර්තාකරණය සිදු වන බව මින් අර්ථවත් වේ. නිරන්තර ව සිදු වන කර්කශ වාර්තාකරණය හා ආගන්තුක ආක්‍රමණශීලිත්වය, ආකර්ෂණීය අකුරු (Flourish) හා ඕපාදූප (Gossip) මේ ජනමාධ්‍ය කලාවේ ප්‍රධාන ලක්ෂණයන් වේ. උල් දත් නියවා ගොරවන බල්ලෙකු සේ ජනමාධ්‍ය සමාජය සමඟ හැසිරෙන බව මෙම සංකල්පය පැහැදිලි කොට දක්වයි. ශ්‍රී ලංකාවේ ද ජනමාධ්‍ය කලාව වසර පහක වැනි කාලයක සිට එ වැනි ලක්ෂණ ගෙන ඇති බව පෙනේ. මේ ජනමාධ්‍ය කලාව ආගන්තුක භාවයේ සිට කඩාකප්පල්කාරිත්වය දක්වා

ප්‍රවෘත්තියේ බලය හසුරවයි. මාධ්‍යකරුවන්ගේ රුචි අරුචිකම් මත න්‍යාය පත්‍රයට අනුව ප්‍රවෘත්තිවලට ඒ ඒ ප්‍රමුඛතාවන් ලබා දේ. රටක රාජ්‍යය හෝ ආණ්ඩුව හෝ පිළිබඳ පිළිගැනීමක් නොදක්වයි. එමගින් සමාජය තුළ ආවර්තී නිහඬ බව (Spiral of silence) උත්පාදනය වේ. අනෙක් අතින් මින් කියැවෙන්නේ නූතන මාධ්‍ය ක්‍රියාකාරකම් තුළින් කුඩා ජන කණ්ඩායම්වල හෝ සුළු ජන කොටස්වල ජනමතයන් අතිශයෝක්තියට නඟා ප්‍රධාන හඬක් ලෙස සමාජ ප්‍රකාශනයට එක් කළ හැකි බව යි. සුළු ජන කොටස්වල ජන මතයට ඉඩ ලබා දීම මෙයට වඩා වෙනස් වූ තත්ත්වයකි. ඊට අමතර ව මාධ්‍ය වාර්තා 'නගරයේ නව ක්‍රීඩාව' (The new game in town) බවට ද පත් ව තිබේ. ජනමාධ්‍ය ඇසුරු කරන නාගරික තීරක පැලැන්තිය මෙ ලෙස මේ නාගරික නව ක්‍රීඩාවට හවුල් වේ. ව්‍යාපාරිකයා, දේශපාලනඥයා, ක්‍රීඩාවේ තීරකයන් ලෙස පෙනී සිටි, ක්‍රීඩකයින් වන්නේ මාධ්‍යකරුවා යි.

ලැරී ජේ. සබාටෝ (Larry J. Sabato) ඇමරිකානු ජනමාධ්‍ය අධ්‍යයනය කරමින් "හපා කන බලු ජනමාධ්‍ය කලාව" (attack dog Journalism) නම් සංකල්පය හඳුන්වා දෙයි. මාධ්‍ය කලාවෙන් ආරක්ෂා විය යුතු හා වර්ධනය කළ යුතු විවෘතභාවය හා වගකීම මේ ඔස්සේ පැහැර හැරේ. එසේ නොමැතිනම් අවතක්සේරුවට ලක් කෙරේ. එසේ ම ඔහු 'උන්මාද පෝෂක' (Feeding Frenzy) සංකල්පය හඳුන්වා දෙමින් නූතන මාධ්‍ය මඟින් ග්‍රාහකයා ඉතා අසාධාරණ ආස්තානයකට පමුණුවන බව පෙන්වා දෙයි.

## මූලාශ්‍ර


- *Martin A. Lee and Norman Solomon. (1990) Unreliable Sources. New York, NY*
- *Paulicelli, Eugenia (2001). The Cambridge companion to modern Italian culture.Cambridge, England: Cambridge University Press.*
- *Pavlik, J. V., (2001). Journalism and New Media. New York: Columbia University Press. Pugliese, Stanislao G. (1999). Carlo Rosselli: socialist heretic and antifascist exile.*
- *Cambridge, MA: Harvard University Press.*
- *Schultz, Julianne (1998). Reviving the fourth estate. Cambridge, England: Cambridge-University Press.*
- *Bryant. J., and Zillmann, D.,(2002). Media Effects: Advances in Theory and Research. Mahwah, NJ: Lawrence Erlbaum Associates.*

- *Bucy, E.P., and Newhagen, J. E., (2004). Media Access: Social and Psychological Dimensions of New Technology Use. Mahwah, NJ: Lawrence Erlbaum Associates.*
- *Couldry, N., and McCarthy, A., (2004). Mediaspace: Place, Scale, and Culture in a Media Age. New York: Routledge.*
- *Macknight, Thomas (1858). History of the life and times of Edmund Burke. London: Chapman and Hall.*
- *Larry J. Sabato, Feeding Frenzy: Attack Jounalism and American Politics Lanahan Pub Ine (first published 1991) 2000*
- *Craig Johnson (2010) Junkyard Dogs, Walt Longmire*